# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.15 පැය 1515 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/66 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**කරාතේ තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.**

ශ්‍රී ලංකා ෂෝටෝකාන් කරාතේ දෝ සම්මේලනය මඟින් 25 වන වරටත් සංවිධානය කරනු ලැබූ 2024 ජාතික ෂෝටෝකාන් ශූරතාවය 2025.01.11 වන දින කොළඹ රාජකීය විදුහල් ගෘහස්ථ ක්‍රීඩා පිටියේදී පැවත්විණි.

මෙම ශූරතාවලිය සඳහා කරාතේ ක්‍රීඩා සමාජ 155 ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 750 ක් පමණ විවිධ ඉසව් යටතේ තරඟ වැදුණු අතර එහිදී ශ්‍රී ලංකා පොලිසිය නියෝජනය කරමින් ක්‍රීඩකයින් 20 ක් සහභාගී වී රන් පදක්කම් 06 ක්, රිදී පදක්කම් 06 ක් හා ලෝකඩ පදක්කම් 06 ක් ලබාගෙන ශ්‍රී ලංකා පොලිසියට කීතර්‍ීයක් ලබා දී ඇත.

ශ්‍රී ලංකා පොලිස් කරාතේ සංගමයේ සභාපති ලෙස නියෝජ්‍ය පොලිස්පති ඒ.පී.ජේ.චන්ද්‍රකුමාර මහතා කටයුතු කරන අතර ලේකම් ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පී.ජී.සරත්චන්ද්‍ර ගුණතිලක, පුහුණුකරු ලෙස එම්.එන්.පුරම්පති, කණ්ඩායම් නායක ලෙස පොලිස් පරික්ෂක රජිවු ප්‍රසන්න කටයුතු කරන අතර කළමණාකරු ලෙස උප පොලිස් පරික්ෂක පුබුදු චතුරංග යන මහත්වරු කටයුතු කරනු ලබයි.

**මෙම අවස්ථාවට අදාල ඡායාරූප**







පොලිස් මාධ්‍ය කොට්ඨාසය.